# බළන්ගොඩ නගර සභාව

## 2019-09-10 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.09.10**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 01. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 02. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 09. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනී | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනී | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව හා සම්මත කිරීම.**

අද දින සභාවට පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගනිමින් 2019-09-10 වන දින මාසික මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමා, 2019.08.15 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් 2019.08.15 දිනැති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාව සඳහා සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විමසා සිටි අවස්ථාවේ දී ගරු නාගරික මන්ත්‍රි එම්.ජේ.මාලීක්ෂා මැතිතුමන් විසින්, 2019-8-15 දිනැති මහ සභාවේ හදිසි යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ "2018.08.08 දින පැවති මහ සභාවේ 05ඃ10ඃ01 යෝජනාව පරිච්චින්න කිරීමේ යෝජනාව" න්‍යාය පත්‍රයට ඇතුළත් නොකරන ලද යෝජනාවක් බැවින් එය සභා සම්මත වීම පිළිගත නොහැකි බවත්, න්‍යාය පත්‍රයට ඇතුළත් නොකරන ලද යෝජනාවක් නීත්‍යානුකූල නොවන බවත් පවසන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ හදිසි යෝජනා යටතේ මෙම යෝජනාව ඉදිරිපත් වූ නිසා මෙම තීන්දුව නිශ්ප්‍රභා කළ හැකි නමුත් සභා වාර්තාවේ දෝෂ සහගත බව නිසා 2018.08.08 දින පැවති මහ සභාවේ 05ඃ10ඃ01 යෝජනාව ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොපවතින බවයි. එබැවින් තානායම් පිවිසුම් මාර්ගය "අබුසාලි මාවත" ලෙස නම් කිරීම සඳහා වූ යෝජනාව නැවත වරක් මුල සිටම ගෙන ආ යුතු බව වැඩිදුරටත් පවසන ලදී.

එමෙන්ම සභාවේ සාමුහිකත්වය හා සමානාත්මතාවය නිසා හදිසි යෝජනාව පිළිගත් නමුත් අවශ්‍යම අවස්ථාවන්හි දී පමණක් හදිසි යෝජනා ගෙන ඒම පිළිබඳ සැලකිලිමත් වන ලෙසත්, මේ සම්බන්ධව සභාවේ ගැටුමක් ඇති නොවන ආකාරයට කටයුතු කිරීමට වගබලා ගන්නා ලෙසත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සංශෝධනයන් ලෙස 05ඃ01ඃ02 යෝජනාවේදී ඊ.ජේ.කේ.පී.පියදාස මහතාගේ පුතුන් සභාවට ගෙන්වන ලෙස තමන් පැවසූ නමුත් එය සභා වාර්තාවේ සටහන් වී නොමැති බව පවසා සිටියේය.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තාව සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- අද දින තමාට අවමගුල් උත්සවයක් සඳහා සහභාගි වීමට තිබෙන බැවින් දූන උගත් බුද්ධිමත් සභිකයන් වශයෙන් නිකරුණේ කාලය ගත නොකර සභාවේ වැඩ කටයුතු කරගෙන යාම සඳහා තමාට සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

- ගරු නාගරික මන්ත්‍රි අකිල එල්ලාවල මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා අසනීප බැවින් සභාවට සහභාගී විය නොහැකි බවට ලිපි ඉදිරිපත් කර ඇති අතර එතුමන්ලාගේ නිවාඩු අනුමත කරන බවට ගරු සභාපතිතුමන් විසින් සභාව දූනුවත් කරන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම.**

- බළන්ගොඩ නගර සභාවේ මහ සභාව පැවැත්වෙන දිනයන්හිදි සර්වෝදය දේශෝදය වැඩසටහනේ බළන්ගොඩ දේශෝදය මණ්ඩලයෙන් මාසිකව දෙදෙනෙකු සහභාගි කරවීම සඳහා අවසර ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.
- කිරිඳිගල වැලිහරනාව මාර්ගය සංවර්ධනය කිරීමේ ඇස්තමේන්තුව සකස් කිරීමේදී මාර්ගය පටු ස්ථානයක පැති බැම්මක් යෙදීමට අවශ්‍ය කටයුතු සඳහා ඇස්තමේන්තුව සකස් කළ අතර එම පැති බැම්ම යෙදීමේදී ඉඩම් හිමිකරු ඒ සඳහා අකමැත්ත ප්‍රකාශ කළ බැවින් එම පැති බැම්ම හා කාණුව සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදන මෙම මාර්ගයේම අතුරු මාර්ග සංවර්ධනය කිරීම සඳහා යෙදවීමට අවශ්‍ය කටයුතු සඳසා දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී ඊ.ජේ.ජේ.ප්‍රේම කුමාර මැතිතුමා ඉල්ලීමක් කර ඇති බවත්, ඉහත ඉල්ලා ඇති පරිදි කටයුතු කිරීමට අනුමත කරන අතර ඉතිරිවන මුදල් යොදවා තොසිල ගාර්ඩන්ස් ප්‍රදේශයේ මාර්ග සංවර්ධනයට යොමු කිරීමට කටයුතු කරන ලෙසත් සභාපතිතුමන් විසින් පවසන ලදී.

**04. කල් දී ඇති යෝජනා**

***04.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා***

04෴01෴01 2020 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවේ ගැසට් නිවේදන පළ කිරීම.

- වරිපනම් බදු පැනවීම.
- වෙළඳ බලපත්‍ර ගාස්තු /කර්මාන්ත බදු /ව්‍යාපාර බදු පැනවීම.
- සුනඛ ගාස්තු පැනවීම.
- කසල ගාස්තු පැනවීම.

- සෝ සාතක ආඥා පනත ප්‍රකාරව කොටු ගාස්තු, සෝ ඝාතක බලපත්‍ර ගාස්තු පැනවීම.
- බළන්ගොඩ නගර සභාවෙන් සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු පැනවීම.
- මස් පිණිස සතුන් මැරීම හෝ මරණ ලද සතුන්ගේ මස් ප්‍රදර්ශනය සම්පූර්ණයෙන්ම තහනම් දින නිවේදනය කිරීම.
- රථ වාහන නැවතුම් සීමාව හා රථ වාහන නැවතුම් ගාස්තු නිවේදනය කිරීම.

2020 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවට අදාළ ගැසට් නිවේදන පළ කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් වරිපනම් බදු වැඩිකරන්නේදැයි විමසූ අතර, කසළ බද්ද පැනවීමට පෙර වැඩි වශයෙන් කසළ එක්රැස් වන ස්ථාන වල හිමිකරුවන් සමඟ සාකච්ඡා කරන ලෙස පවසා සිටින ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් වරිපනම් බදු අයකිරීමේ තක්සේරුව මේ වසරේ සිදු කළ ද ලබන වසරේ එය ක්‍රියාත්මක කිරීමට සභාව විසින් අවසර නොදෙන අතර පවතින තක්සේරුවම ලබන වසරේ දී ක්‍රියාත්මක කරන ලෙස පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් වරිපනම් බදු/වෙළෙඳ බලපත්‍ර/ කසළ ගාස්තු සියළුම වෙළෙඳසැල් සඳහා බලපාන බැවින් මෙම ගාස්තු ලබන වසරේදී වැඩි වන්නේද නැද්ද යන්න පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කරන ලෙස පැවසීය. එමෙන්ම පාස්කු ඉරුදින ප්‍රහාරයත් සමඟ පාරිභෝගිකයන්ගේ පැමිණීමේ අඩු වීම නිසා මේ වන විට වෙළඳසැල් හතක් පමණ වසා ඇති බැවින් ගාස්තු වැඩි කිරීමේ දී ඒ පිළිබඳව සැලකිලිමත් වන ලෙස වැඩිදුරටත් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ වරිපනම් බදු තක්සේරුව මේ දිනවල සිදු කරන බවත්, තක්සේරු කිරීම අවසන් වූ විට පමණක් වරිපනම් ගාස්තුව වැඩි විය හැකි නමුත් එමඟින් වරිපනම් ප්‍රතිශතය වැඩි නොවන බවත් ය. එමෙන්ම සෑම වසර පහකට වරක් වරිපනම් බදු තක්සේරුව සිදු කළ යුතු බව පැවසූ ගරු සභාපතිතුමා අනෙකුත් ගාස්තුවල වැඩිවීමක් සිදු නොවන අතර කසළ ගාස්තු අයකිරීම සිදු කරනු ලබන්නේ ද කළමනාකරණය කර ගත නොහැකි කසළ සඳහා පමණක් බව ප්‍රකාශ කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:02 2020 වර්ෂය සඳහා පොදු වෙළඳසැල මස් කඩ ටෙන්ඩර් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම.

2020 වර්ෂය සඳහා පොදු වෙළඳසැල මස් කඩ ටෙන්ඩර් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සීමාව තුළ ගෝ ඝාතකාගාරයක් හිමි අයට පමණක් වන සේ සීමා කර ටෙන්ඩර් කරන ලෙස පවසා සිටියේය. එමෙන්ම බළන්ගොඩ නගරයෙන් පිටස්තර පුද්ගලයෙකුට ලබා දෙන්නේ නම් බළන්ගොඩ ප්‍රදේශය තුල ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාමට අවස්ථාව ලබා දෙන ලෙසත්, බළන්ගොඩ නගරයට පිටතින් මස් රැගෙන ඒමට තමන් විරුද්ධ බවත් පවසමින් මේ පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු පැහැදිලි කරන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ ව්‍යාපාර බළන්ගොඩ ජනතාවට ලබා දිය යුතු අතර වෙනත් ප්‍රදේශවල ව්‍යාපාරිකයන් සඳහා මෙම අවස්ථාවන් ලබා දීම අවාසි සහගත බව ද මස් කඩ ටෙන්ඩරය බළන්ගොඩ බල ප්‍රදේශයෙන් පිටත ලබා දීමට තමන් පෞද්ගලිකව විරුද්ධ වන බව ද පවසා සිටියේය. එමෙන්ම සභාවේ ආදායම ගැන පමණක් සිතමින් කටයුතු කිරීම සුදුසු නොවන අතර මහජනතාවගේ පැත්තෙන්ද සිතා බලා තීරණයක් ගත යුතු බවත්, බළන්ගොඩ වෙළෙඳ ව්‍යාපාරිකයා ආරක්ෂා කළ යුතු බවත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් තමා ද ගරු උප සභාපතිතුමා සමඟ එකඟ වන අතර බළන්ගොඩ ආදායම බළන්ගොඩ වෙළෙඳ ව්‍යාපාරිකයා වෙත යා යුතු බව පවසා සිටියේය.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, පසුගිය මස් කඩ ටෙන්ඩරයේ දී බළන්ගොඩ බල ප්‍රදේශයේ ගෝ ඝාතකාගාර හිමි අයගෙන් පමණක් ටෙන්ඩර්පත් කැඳවීම සිදු කළ නිසා රුපියල් මිලියන 5ක පමණ අලාභයක් සභාවට සිදු වූ අතර සම්මත අතුරු ව්‍යවස්ථාවේ 18 වන වගන්තිය ප්‍රකාරව සභාවේ පාලන ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ වධකශාලාවකදී මරණ ලද සතුන්ගේ මස් පමණක් අලෙවි කළ යුතු බවට සඳහන් වන බැවින් එම අවස්ථාවේදී ඒ අනුව කටයුතු කරනු ලැබූ බව පැවසීය.

අනතුරුව මේ සම්බන්ධව නීතිපතිගේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කළ අතර, එහි දී වෙනත් බල ප්‍රදේශයක ඝාතන මඩුවක ඝාතනය කළ ගවයකුගේ මස් ප්‍රවාහනයට හා විකිණීමට බලපත්‍රයක් ලබා ගත යුතු බවට මතයක් ප්‍රකාශ කර ඇති බවත්, ඒ අනුව සභාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයකට යටත්ව වෙනත් ගෝ ඝාතකාගාරයක මරණ ලද සතුන්ගේ මස් ප්‍රවාහනය හා විකිණීම කළ හැකි අතර බල ප්‍රදේශයෙන් පිටත

පිහිටියා වූ ගෝ ඝාතකාගාරයක මරණ ලද සතුන්ගේ මස් අලෙවිය සඳහා අවසර ලබා දිය හැකි බවත්, එසේ නොකර සිටීම තුළ විශාල මූල්‍ය පාඩුවක් සභාවට සිදු වී එම මූල්‍ය පාඩුව විගණනයට බඳුන්විය හැකි බැවින් යම් අයුරකින් සභාවට අයභාර විය හැකි බවත් වැඩිදුරටත් පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා විසින් මස් කඩ ටෙන්ඩරය පිටත ව්‍යාපාරිකයන්ට ලබා දුනහොත් බළන්ගොඩ ව්‍යාපාරිකයාට අසාධාරණයක් සිදු වන බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ද මේ සම්බන්ධව අදහස් දක්වමින් මස් කඩ පවත්වාගෙන යාම සඳහා බළන්ගොඩ නගරයට ආවේණික පිරිසක් සිටින බැවින් ඔවුන්ටම මෙම අවස්ථාව ලබා දෙන ලෙස පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, බළන්ගොඩ ව්‍යාපාරිකයා සෑම විටම අප සමඟ සම්බන්ධ වන බැවින් ඔවුන් ආරක්ෂා කිරීම කළ යුතු අතර බළන්ගොඩ බල ප්‍රදේශයට පමණක් වන ලෙස සීමා යොදා ගාස්තුව වැඩි කර ටෙන්ඩර් කිරීම සුදුසු බව පවසන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මස් කඩ ගාස්තු වැඩි කිරීමට තමන් එකඟවන බව පැවසීය.

මෙහිදී ගරු සභාපතිතුමා නැවත අදහස් දක්වමින් මෙතෙක් අදහස් ඉදිරිපත් කළ සියළු මන්ත්‍රීවරුන් මස් කඩ ටෙන්ඩරය බළන්ගොඩ බල ප්‍රදේශයෙන් පිටත ලබා දීමට විරුද්ධව අදහස් ප්‍රකාශ කළ බැවින් 2020 වර්ෂය සඳහා මස් කඩ ටෙන්ඩර් කිරීමේදී අවම ලංසු මුදල වශයෙන් දැනට අයකරන ගාස්තුවට 10%ක මුදලක් වැඩිකර බළන්ගොඩ බල ප්‍රදේශය තුළ ගෝ ඝාතකාගාරයක් හිමි අයගෙන් පමණක් ටෙන්ඩර් පත් කැඳවීම සුදුසු බවට කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් 2020 වර්ෂය සඳහා පොදු වෙළඳසැල මස් කඩ සඳහා අවම ලංසු මුදල වශයෙන් දැනට අයකරන ගාස්තුවට 10%ක මුදලක් වැඩිකරමින් බළන්ගොඩ බල ප්‍රදේශය තුළ ගෝ ඝාතකාගාරයක් හිමි අයගෙන් පමණක් ටෙන්ඩර් පත් කැඳවීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:03 2020 වර්ෂය සඳහා මහජන පොළ ආපන ශාලාව ටෙන්ඩර් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම.

2020 වර්ෂය සඳහා මහජන පොළ ආපන ශාලාව ටෙන්ඩර් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් පවත්නා මිල අවම ලංසුව ලෙස ඉදිරිපත් කරමින් ටෙන්ඩර් කිරීම සුදුසු බව පවසන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් 2020 වර්ෂය සඳහා මහජන පොළ ටෙන්ඩර් කිරීමේදී පවත්නා මිලම අවම ලංසුව ලෙස ඉදිරිපත් කරමින් ටෙන්ඩර් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:04 පොදු වෙළෙඳසැල අංක 03 කඩ කාමරය ටෙන්ඩර් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම.

පොදු වෙළෙඳසැල අංක 03 කඩ කාමරය ටෙන්ඩර් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ 10% ක ගාස්තුවක් අඩු කර අවම ලංසුව ඉදිරිපත් කරන ලෙසයි.

ඒ අනුව වර්තමාන ලංසු මුදලින් 10%ක් අඩුකරමින් ටෙන්ඩර් පත් කැඳවීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කළ අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් වර්තමාන ලංසු මුදලින් 10% ක් අඩුකර ලංසුව ඉදිරිපත් කර කඩ කාමරය ටෙන්ඩර් කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:05 2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල මාළු කඩ ටෙන්ඩර් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම.

2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල මාළු කඩ ටෙන්ඩර් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා, අංක 09/10 මාළු කඩ දෙක මේ වන විට සභාව වෙත පවරා ගෙන ඇත්ද, එසේනම් එම කඩ දෙකත් ටෙන්ඩර් කරන්නේද යන්න විමසා සිටි අතර ටෙන්ඩර් කරන්නේනම් සියළුම මාළු කඩ ටෙන්ඩර් කරන ලෙසත්, අංක 09/10 මාළු කඩ දෙක හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීමට තමා විරුද්ධ වන බවත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් පොදු වෙළෙඳසැල මාළු කඩ අංක 09/10 කඩ කාමර සඳහා නැවත නඩු දැමීමට ඊ.ජේ.කේ.පී.පියදාස මහතාගේ පුතුන් සූදානම් වන බැවින් එසේ නඩු දැමුවහොත් එම කඩ දෙක ටෙන්ඩර් නොකර අනෙක් මාළු කඩ ටෙන්ඩර් කිරීම අසාධාරණ බව සඳහන් කරන ලදී.

පොදු වෙළෙඳසැල අංක 9/10 මාළු කඩ සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව පැවසූ ගරු සභාපතිතුමා 2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල මාළු කඩ ටෙන්ඩර් කිරීමේදී රු.10,000.00 ක පොදු ගාස්තුවක් අවම ලංසුව ලෙස ඉදිරිපත් කරමින් ටෙන්ඩර් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් 2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල මාළු කඩ සඳහා රු.10,000.00 ක පොදු ගාස්තුවක් අවම ලංසුව ලෙස ඉදිරිපත් කරමින් ටෙන්ඩර් කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:06 2020 වර්ෂය සඳහා නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම ටෙන්ඩර් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම.

2020 වර්ෂය සඳහා නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම ටෙන්ඩර් කිරීමට සඳහා සහා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

2020 වර්ෂය සඳහා නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම ටෙන්ඩර් කිරීමේදී මෙම වසරේ බදු දී ඇති මුදල අවම ලංසුව ලෙස ඉදිරිපත් කරමින් ටෙන්ඩර් කිරීම සුදුසු

බවට ගරු සභාපතිතුමන් විසින් කළ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:07 2020 වර්ෂය සඳහා නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම ටෙන්ඩර් කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

2020 වර්ෂය සඳහා නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම ටෙන්ඩර් කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

2020 වර්ෂය සඳහා නගරයේ රථ වාහන නැවතුම් ගාස්තු අය කිරීම ටෙන්ඩර් කිරීමේදී මෙම වසරේ බදු දී ඇති මුදල අවම ලංසුව ලෙස ඉදිරිපත් කරමින් ටෙන්ඩර් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් සථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:08 2020 වර්ෂය සඳහා පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීම.

2020 වර්ෂය සඳහා පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීමට සහා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් පොදු වැසිකිළි සඳහා ගාස්තුව වැඩි කිරීම සමගම ලබා දෙන පහසුකම් ද වැඩි කරන ලෙස පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීමේ ගාස්තුව වැඩි කරන ලෙස පවසා සිටින ලදී.

අනතුරුව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ජල බිල්පත් හා විදුලි බිල්පත් ටෙන්ඩර්කරුටම ගෙවන්න සිදුවන්නේ නම් ගාස්තුව වැඩි නොකරන ලෙස පවසා සිටින ලදී.

නැවත වරක් අදහස් දැක්වූ ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා මෙහි දී මාස තුනක ඇප තැන්පතුවක් ලබා ගැනීම සුදුසු බව පවසන ලදී.

ඒ අනුව ජල බිල්පත් හා විදුලි බිල්පත් ගෙවීම සඳහා අදාළ ටෙන්ඩර්කරුටම ලබා දී පවත්නා ගාස්තුව අවම ලංසුව ලෙස ඉදිරිපත් කරමින් ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කළ අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:09 2020 වර්ෂය සඳහා කුණු කසළ එකතු කිරීම හා ඉවත් කිරීම ටෙන්ඩර් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

2020 වර්ෂය සඳහා කුණු කසළ එකතු කිරීම හා ඉවත් කිරීම ටෙන්ඩර් කිරීමට සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් කුණු කසළ එකතු කිරීමේ හා ඉවත් කිරීමේ කාර්යය සභාවේ කම්කරුවන් සාර්ථකව සිදු කරන බැවින් ඔවුන්වම යොදාගනිමින් ඉටු කර ගැනීම සුදුසු බව පවසා සිටින ලදී.

ඒ අනුව සභාවේ සේවකයින් යොදා ගනිමින් කසළ එකතු කිරීමේ කටයුතු තවදුරටත් ඉටු කිරීම සුදු බවට ගරු සභාපතිතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිතව සම්මත විය.

04:01:10 2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ පුවත්පත් දැන්වීම් සිංහල හා දමිළ මාධ්‍යයෙන් එක්වරක් පළකිරීම හා සැපයුම්කරුවන් ලියාපදිංචි කළ හැකි අයිතම හා ගාස්තු පිළිබඳ සභා අනුමැතිය ලබා ගැනීම.

2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ පුවත්පත් දැන්වීම් සිංහල හා දමිළ මාධ්‍යයෙන් එක්වරක් පළකිරීම හා සැපයුම්කරුවන් ලියාපදිංචි කළ හැකි අයිතම හා ගාස්තු පිළිබඳ සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:11 බලංගොඩ නගර සභාව මඟින් 2017/2018 හා 2019 හා 2018/2019 අධ්‍යයන වර්ෂ සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා දීමට සහා අනුමැතිය ලබා ගැනීම.

බලංගොඩ නගර සභාව මඟින් 2017/2018 හා 2019 හා 2018/2019 අධ්‍යයන වර්ෂ සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා දීමට සහා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා එක් ශිෂ්‍යයෙකු සඳහා රු.10,000.00 ක මුදලක් ලබා දීම සුදුසු බව යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

රාජ්‍ය සේවකයින් ගේ දරුවන්ට කිසිඳු ශිෂ්‍යත්වයක් හිමි නොවන බැවින් අඩු ආදායම්ලාභි දරුවන් සඳහා පමණක් වන නිර්ණායකය ඉවත් කිරීම සුදුසු බව සභාවේ මතය විය. එබැවින් ඒ සම්බන්ධව පළාත් සභාව දැනුවත් කිරීමට ගරු සභාපතිතුමා තීරණය කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:12 2019 වර්ෂය තුළ අඩු ආදායම්ලාභීන් සඳහා වැසිකිළි ආධාර ලබා දීමට සහා අනුමැතිය ලබා ගැනීම.

2019 වර්ෂය තුළ අඩු ආදායම්ලාභීන් සඳහා වැසිකිළි ආධාර ලබා දීමට සහා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් එක් කොට්ඨාසයක් සඳහා එක් වැසිකිළියක් බැගින් ඉදිකර දීම සුදුසු බවට කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:13 සේවා ගිවිසුම් අළුත් කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

- පී.ආර්.ශ්‍යාමා මිය සෞඛ්‍ය කම්කරු
- එම්.ඩී.ජයන්ති පෙරේරා මිය පෙර පාසල් පාලිකා

සේවා ගිවිසුම් අළුත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:14 බෝම්බුව ක්‍රීඩා පිටිය සඳහා විදුලිය ලබා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම.

බෝම්බුව ක්‍රීඩා පිටිය සඳහා විදුලිය ලබා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මෙය අනිවාර්යයෙන් ඉටු කළ යුතු කාර්යයක් බව පැවසීය.

මෙහිදී අදහස් දක්වූ ගරු සභාපතිතුමා මාස 03ක සාමාන්‍ය විදුලි බිලෙහි වටිනාකම මෙන් තුන්ගුණයක රැඳවුමක් තබා ගනිමින් බෝම්බුව සේවා පියස හරහා මෙය ඉටු කළ හැකි බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:15 බළන්ගොඩ පරිවාස කාර්යාලයේ ඉදි කිරීම් කටයුතු "එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය" සඳහා ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම.

බළන්ගොඩ පරිවාස කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු "එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිතිය" සඳහා ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:16 නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙහි තාවකාලික රථගාලක් පවත්වාගෙන යාම සඳහා සංවර්ධනය කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙහි තාවකාලික රථගාලක් පවත්වාගෙන යාම සඳහා සංවර්ධනය කිරීමට සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:17 නව පොදු වෙළෙඳසැල ගොඩනැගිලි සැලසුම ඇඳීමට 2% අත්තිකාරම් මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

දැනට 2% ක අත්තිකාරම් මුදලක් ඉල්ලා ඇති නමුත් නව පොදු වෙළෙඳසැල ගොඩනැගිලි සැලසුම සකස් කිරීම වෙනුවෙන් ඇස්තමේන්තු මුදලින් 6%ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු වන බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 05. මන්ත්‍රී යෝජනා

### 05:01 ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා

05:01:01 බළන්ගොඩ කල්තොට මාර්ගය පුද්ගලික බස් හා ශ්‍රීලංගම බස් ධාවනයේ වේගය සීමා කිරීම.

ගරු උප සභාපති එම්.ටී.එම්. මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා පසුගිය මාස හය තුළ ලංකාවේ රිය අනතුරු 1765 ක් සිදු වී තිබෙන අතර ඉන් 60% ක් අධික වේගය නිසා සිදු වූ රිය අනතුරු බව පවසන ලදී. එමෙන්ම කල්තොට පාරේ ගමන් කරන බස්රථ කිරිමැටිතැන්න සිට දෙහිගස්තලාව දක්වා ඉතා සෙමින් ගමන් කරන නමුත් එතැන් සිට බලගහමුල දක්වා ඉතා වේගයෙන් ගමන් කරන බවත්, එම නිසා දෙහිගස්තලාව මුස්ලිම් දේවස්ථානය අසළ සිට බලගහමුල දක්වා විශාල තදබදයක් පවතින බවත් පැවසීය.

එමෙන්ම මෙම ප්‍රදේශයේ විශාල අනතුරු සංඛ්‍යාවක් සිදු වී තිබීමත් මෙම මාර්ගයේ පාසල් දරුවන් විශාල ප්‍රමාණයක් ගමන් කරන නිසාත් මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන ලෙස පැවසූ ගරු උප සභාපතිතුමා මේ පිළිබඳව පෞද්ගලික බස්රථ හා පොලිසිය දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස වැඩිදුරටත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් දෙහිගස්තලාව සිට බළන්ගොඩ දක්වා කාණු පද්ධතිය අක්‍රමවත් බවත්, වැසි අවස්ථාවලදී ජලය මාර්ගයට පැමිණීම නිසා මෝටර් සයිකල්වල ගමන් කරන ජනතාව අපහසුතාවයට පත්ව ඇති

බවත් පැවසූ අතර මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස වැඩිදුරටත් සඳහන් කරන ලදී.

මෙහිදි අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් දෙහිගස්තලාව සිට බළන්ගොඩ දක්වා කාණු පද්ධතිය පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර තිබෙන අතර ඔවුන් හැකි ඉක්මනින් මෙම කාණු පද්ධතිය සකස් කර දෙන බවට පොරොන්දු වී ඇති බවත්, මෙම මාර්ගයේ බස්රථ පමණක් නොව මෝටර් සයිකල් ද ඉතා වේගයෙන් ගමන් කරන බවත් පවසන ලදී.

මෙය කාලෝචිත යෝජනාවක් බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා කාණු පද්ධතිය අක්‍රමවත් නිසා වැසි අවස්ථාවල දී අතුරු මාර්ගවල සිට ගලා එන ජලය ප්‍රධාන මාර්ගයේ ගලා යන බව පවසා සිටියේය.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් රථ වාහන කමිටුවේ දී ද බස් රථ වල වේග සීමා යෙදීම ගැන සාකච්ඡා කළ අතර එහිදී මාර්ග සංවර්ධන අධිකාරිය වේග සීමා යොදන බවට පොරොන්දු වූ බව පැවසීය.

මේ සම්බන්ධව පොලිසිය දැනුවත් කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:02 ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය**

05:02:01 2018/09/11 දින දොරවෙල ඔය හුනුකුඹුර පාරේ වසා දමන ලද බෝක්කුව ශුද්ධ කර දෙන මෙන් ඉල්ලා සිටින ලද ලිපියට මේ වන විට වසරක් ගත වී ඇති අතර ඒ හා බැඳුනු නඩු තීන්දුවෙන් සභාවට එය ශුද්ධ කිරීමට බලය ඇති නමුත් මේ වන තුරු එම කාර්යය සිදු නොවී ඇති බැවින් කඩිනමින් විසඳුමක් ලබා දීම.

ගරු නාගරික මන්ත්‍රීනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීනි පී.චන්ද්‍රලතා මැතිතුමිය හුනුකුඹුර පාරේ වසා දමන ලද බෝක්කුව පිළිබඳ 2007/11/02 දින ලබා දුන් නඩු තීන්දුව අනුව මෙය ශුද්ධ පවිත්‍ර කිරීමට බලය ලැබී ඇතත් මේ වන තෙක් එය ඉටු නොකළේ මන්දැයි විමසූ අතර මෙම බෝක්කුව පිළිසකර කිරීමට හැකිනම් වතුර ගලා යාමෙන් මාර්ගයට සිදුවන හානිය අවම කර ගත හැකි බව පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ එසේ බෝක්කුව පිළිසකර කර ජලය ගලා යාමට සැලැස්වුවහොත් ඒ අසළ තිබෙන කුඹුරට එමඟින් හානි සිදු විය හැකි බැවින් මාර්ගයේ පවතින කාණුවට සම්බන්ධ වන සේ කාණුවක් සකස් කරන බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:03 ගරු නාගරික මන්ත්‍රිනි එම්.සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

05:03:01 කරව්කැටිය බේකරියෙන් පිටවන ජලය බැස යාම සඳහා කාණුව පිළිසකර කිරීම.
05:03:02 උඩකන්ද කරව්කැටිය කානු පද්ධතිය වතුර බැසයන සේ සකස් කිරීම.

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී 05:03:01 යෝජනාව පිලිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය මෙම කාණුව පිළිසකර කිරීම සභාවෙන් ඉටු කළ නොහැකි නම් බේකරි හිමියා මෙම කාණුව සකස් කිරීමට කැමැත්ත පළ කර ඇති බවත්, රාත්‍රී කාලයේදී වැසිකිලි වලවල් කාණුවට හරවන බවට ගම්වාසීන්ගෙන් චෝදනා ලැබෙන බවත් පවසන ලදී. එමෙන්ම එම ස්ථානයට ගිය පසු එවැනි ප්‍රශ්නයක් නොපෙනෙන නමුත් එම කාණුවේ ජලය රැඳී පවතින බැවින් එය පිළිසකර කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම 05:03:02 යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය උඩකන්ද කරව්කැටිය මාර්ගයේ දෙපැත්තෙම කාණු තිබීමෙන් මාර්ගය පටු වී ඇති නිසා මාර්ගයේ එක් පැත්තකට කාණු යොදා මාර්ගය පුළුල් කර දෙන ලෙස පවසා සිටින ලදී.

මෙහිදී 05:03:01 යෝජනාව පිළිබඳ අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ප්‍රකාශ කර සිටියේ මෙම කාණුවේ අඩි 20 ක පමණ දුරක් පිළිසකර කිරීමට ඇති අතර එය ඉටු කිරීමෙන් මෙම ගැටළුව නිරාකරණය කර ගත හැකි බව යි.

මෙහිදී පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා මෙම කාණුව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය බේකරි හිමියා සැපයීමෙන් පසු නගර සභා සේවකයින් යොදා සකස් කල හැකි බව පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:04 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

05:04:01 ක්‍රීඩා පිටියේ විදුලි ආලෝකය නොමැති ස්ථාන සඳහා විදුලි කණු දමා විදුලි බුබුළු සවි කිරීම.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා ක්‍රීඩා පිටියේ විදුලි ආලෝකය නොමැති ඇතැම් ස්ථාන සඳහා අවශ්‍ය විදුලි කණු ලබා දෙන බවට නගරයේ තරුණ පිරිසක් පොරොන්දු වූ බැවින් ඒ සඳහා අවශ්‍ය විදුලි බල්බ් පමණක් සභාවෙන් ලබා දීමට කටයුතු කල යුතු බව පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:05 ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා**

05:05:01 ඇල්ලෙපොල මහ විද්‍යාලය අසල වේ ගඟේ නාන තොටුපලට බසින පඩිපෙළ ඉදි කිරීම. (රු.50,000.00)

05:05:02 වෙළගේ පුරාණ රජමහ විහාරස්ථානය අසලින් අනිල් මහතාගේ නිවස ඉදිරිපිට වේ ගඟට බසින පඩිපෙළ ඉදි කිරීම.(රු.75,000.00)

ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනා ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

***05:06 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා***

05:06:01 කිවුලවෙල මාර්ගයේ 40m පමණ දුර ප්‍රමාණයක් අලුත්වැඩියා කර ජලය බැස යාම සඳහා කාණු පද්ධතියක් ඉදි කිරීම.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් මෙම ස්ථානයේ දෙපාර්ශවයක් අතර ගැටුම් ඇතිවන ස්ථානයක් බැවින් මෙම කාර්යය ඉටු කර දෙන ලෙස පවසා සිටින ලදී.

මෙහිදී පිළිතුරු ලබා දුන් සභාපතිතුමා පවසා සිටියේ එම ස්ථානය පරීක්ෂා කර ඇති අතර ඉදිරියේදී සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06.හදිසි යෝජනා**

06.01.01 බස් නැවතුම්පළ D/11/1 කඩ කාමරය සභාව වෙත පවරා ගැනීම.

බස් නැවතුම්පළ D/11/1 කඩ කාමරය පී.කේ.ඩී.ඩී.එල් ගුණරත්න මහතා මේ වන තෙක් පවත්වා ගෙන ගිය අතර ඉදිරියට මෙම කඩ කාමරය පවත්වා ගෙන යාමට නොහැකි බව දැනුම් දී ඇති හෙයින් මෙය සභාව වෙත පවරා නැවත ටෙන්ඩර් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.02 RA /06/2018 නඩුව නිශ්ප්‍රභා වී ඇති බව සභාව දැනුවත් කිරීම.

RA /06/2018 නඩුව නඩුව නිශ්ප්‍රභා වී ඇති බව සභාව දැනුවත් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගඑරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන් විසින් පවසා සිටියේ මැටල් කොරි ඉඩම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පවතින ඇප මුදල ලබා ගැනීමට නගර සභාව ඇතුළුව පැමිණිලිකරුවන් 16 දෙනෙක් ඉදිරිපත් වූ අතර ඔවුන් කිසිවෙකුටවත් අයිතිය තහවුරු නොවී මෙම නඩුව නිශ්ප්‍රභා වූ බවයි.

**07. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2019.07.22 දින හා 2019.08.06 දින පැවති මුදල් කමිටු වාර්තා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**08. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | **9,756,045.04** |
| වෙනත් ලැබීම් | **1,941,223.54** |
| මුලු ලැබීම් | **11,697,268.58** |
| පුනරාවර්තන වියදම් | **8,155,202.48** |
| වෙනත් වියදම් | **2,647,602.77** |
| මුලු වියදම් | **10,802,805.25** |

2019.08.01 සිට 2019.08.31දක්වා ඉන්ධන වාර්තාව

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| 226-7521 | 18,720.00 |
| 227-5020 | 33,388.00 |
| 56-1906 | 19,864.00 |
| BC-0005 | 31,200.00 |
| DDR-0008 | 3,120.00 |
| DPP 0006 | 12,552.00 |
| | 1,104.00 |
| FCON0015 | 2,080.00 |
| FP-0002 | 8,400.00 |
| RD-8000 | 5,200.00 |
| GC 0001 | 4,760.00 |
| | 3,400.00 |
| GK-1483 | 5,200.00 |
| GK-6227 | 13,018.00 |
| JD-4684 | 1,360.00 |
| LL-2110 | 14,366.00 |
| | 138.00 |
| MG 0014 | 4,094.00 |
| ND-5124 | 24,128.00 |
| OS-0006 | 1,380.00 |
| PF-4006 | 12,096.00 |
| QL-2901 | 2,176.00 |
| | 2,208.00 |
| RB-4786 | 26,538.00 |
| | 795.00 |
| RC-1107 | 26,036.00 |
| RC-1118 | 20,800.00 |
| RC-8183 | 26,538.00 |

| | |
|---|---:|
| RD-8240 | 30,160.00 |
| RE-2600 | 24,960.00 |
| UQ - 1933 | 1,360.00 |
| | 1,380.00 |
| vi-1833 | 1,088.00 |
| YG-0758 | 2,040.00 |
| ZA - 5039 | 25,480.00 |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්.**

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා තානායම් පිවිසුම් මාවත "අබුසාලි මාවත" ලෙස නම් කිරීමට විරුද්ධව අත්සන් 535කින් යුත් මහජන පෙත්සමක් ලැබී ඇති අතර ඒ පිළිබඳව විශාල මහජන විරෝධයක් තිබෙන බැවින් මෙය විසඳීමට කාලයට ඉඩ දිය යුතු අතර එසේ නොමැති වුවහොත් සභාව ඉදිරියට කරගෙන යාමේ හැකියාවක් නොමැති බව පවසන ලදී.

ඕලුගංතොට වේග සීමා ලකුණු කිරීම පිළිබඳ ප්‍රගතිය කෙසේදැයි විමසා සිටි ගරු මන්ත්‍රීතුමා 2020 වර්ෂය සඳහා ජනතා හිතවාදී අයවැයක් බලාපොරොත්තු වන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය අදහස් දක්වමින් කුමාරගම පල්ලෙකුඹුර මාර්ගය ඉදි කිරීමේදී වාහන හැරවීම සඳහා ස්ථානයක් සැකසිය යුතු බව පැවසූ නමුත් එසේ කිරීමෙන් මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ඇති දුර ප්‍රමාණය අඩුවන බව පවසන ලදී.

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමන්, එම ස්ථානය සකස් නොකර ඉන් ඉදිරියට සකස් කරන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.පී. පේමදාස මැතිතුමා**

මෙහිදී අදහස් දක්වමින් උඩ ඇල්ලෙපොල ගල් පොත්තාරාව ප්‍රදේශයේ වේ ගඟ හරහා පාලමක් යොදන ලෙස තමන් 2018/4/5 වන දින සභාවට ගෙන ආ යෝජනාව පිළිබඳ කඩිනමින් විසඳුමක් ලබා දෙන ලෙස පවසා සිටියේය.

එමෙන්ම 2018/06/14 දින සභාවේ ඉදිරිපත් කළ කුමාරගම බෙත්ථාරාම විහාරස්ථාන මාර්ගය ඉතා අබලන් බැවින් සංවර්ධනය කර දෙන යෝජනාව පිළිබඳ කටයුතු සිදු කරන ලෙස පවසා සිටින ලදී.

2019/05/02 දින සභාවේ පැති කාණුවක් සම්බන්ධව ගෙන ආ යෝජනාව පිළිබඳවද සභාවේ අවධානය යොමු කරමින් මෙම ස්ථානයේ ජලය විශාල වශයෙන් කාන්දු වන නිසා පැති බැම්මක අවශ්‍යතාවය පවතින බවත්, ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙසත් පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා තමන් 2019/02/05 දින සභාවේ දුනුගහමඩල ප්‍රදේශයේ බාධාකාරි තාප්පයක කොටසක් ඉදිකර දෙන ලෙස කළ ඉල්ලීම පිළිබඳවත් අවධානය යොමුකරන ලෙස පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා බෝම්බුව කෝපිවත්ත මාර්ගයේ පාලම ඉදිකිරීමේදී ඒ සඳහා දොඹකර දෙකක් ගතයුතු අතර එම දොඹකර දෙක ගෙන යාම සඳහා විකල්ප මාර්ගයක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් 2019 ඔක්තෝම්බර් මස පොහොය දිනය ඉරිදා දින යෙදී තිබෙන බැවින් එම සතියේ මහජන පොළ සෙනසුරාදා දින පැවැත්වෙන බවට ඊට පෙර සතියෙහිම මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස පවසන ලදී.

එමෙන්ම ලීල් මෝටර්ස් හිමිකරුගේ නිවසට යන මාර්ගය අසල බෝම්බුව මාර්ගය තෙක් දිවෙන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම පිළිබඳව නගර සභාවෙන් මේ වන විට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර එම මාර්ගය පයින් යාමට හැකිවන සේ සකස් කර දෙන ලෙස පවසා සිටින ලදී.

වැඩිදුරටත් අදහස් දක්වූ ගරු මන්ත්‍රීතුමා මහ වීදියේ තානායම් පිවිසුම් මාර්ගයට හැරෙන හන්දියේ සවිකර ඇති " One Way " පුවරුව ගැලවී ඇති බැවින් එය සවි කර දෙන ලෙස පවසා සිටින ලදී.

රසහල, හිලිව්වි හෝටලය හා නව ලංකා හෝටලයෙන් අප ජලය පිටවන කාණුව කොන්ක්‍රීට් කර නොමැති බැවින් එය ඉතා ඉක්මනින් සකස් කරන ලෙසත්, නගරයේ ඇතැම් ස්ථාන වල කොන්ක්‍රීට් ස්ලැබ් කැඩී ඇති බැවින් එම ස්ථාන සකස් කර දෙන ලෙසත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>**ගරු නාගරික මන්ත්‍රීන් සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**</u>

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය බස්නැවතුම්පල සිවිලිම ගැසීමෙන් අනතුරුව පාසල් දරුවන් ලවා චිත්‍ර ඇඳීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙසත්, තමන් එහි වගකීම සම්පූර්ණයෙන් භාර ගන්නා බවත්, සියළු දෙනාගේ සහයෝගය තමාට ලබා දෙන ලෙසත් පවසා සිටින ලදී.

**10. අවසානය**

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථකව හා ඵලදායි ලෙස ඉටුකරමින්, අවශ්‍ය තීන්දු තීරණ සාමුහිකව ලබා ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙමින් සභාවට සම්බන්ධ වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුද කල ගරු සභාපතිතුමා ප.ව.01.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කළේය.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බලංගොඩ නගර සභාව.